00011

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESU3129 - විෂයමාලා න්‍යාය සහ පරිචය**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2014.02.27** **වේලාව - පෙ.ව.01.30 - ප.ව. 04.30**

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑ ම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>I වන කොටස</u>

01. විෂයමාලාව යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

02. විෂයමාලා අරමුණු තෝරා ගැනීමේදී සැළකිය යුතු කරුණු පහක් (05) සඳහන් කරන්න.

03. විෂයමාලාව තිරස්ව හා සිරස්ව සම්බන්ධ කළ යුත්තේ ඇයිදැයි දැක්වීමට හේතු තුනක් (03) දෙන්න.

04. විෂයමාලා අධ්‍යයනය ගුරුවරයාට වැදගත් බව පෙන්වීමට හේතු තුනක් (03) ලියන්න.

05. "විෂයමාලා සංවර්ධනයේ දී සමාජ අවශ්‍යතා සැළකිය යුතු ය." නිදසුන් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

06. 1997 විෂයමාලා ප්‍රතිසංස්කරණ නවීකරණයේ ප්‍රධාන ලක්ෂණ 2 ක් කෙටියෙන් විස්තර කරන්න.

07. ඉගෙනුම් අත්දැකීමක තිබිය යුතු ලක්ෂණ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. 'හන්දෙස්ස' අධ්‍යාපන ක්‍රමයෙහි අරමුණු තුනක් (03) ලියා දක්වන්න.

(ලකුණු 5 x 8= 40)

## II වන කොටස

09. (i) ටයිලර්ගේ විෂයමාලා ආකෘතිය පැහැදිලි කර එහි දුබලතා හඳුනාගන්න.
(ලකුණු 10)

(ii) එම දුබලතා වීලර්ගේ ආකෘතියෙන් මඟහරවා ගත හැක්කේ කෙසේදැයි පරීක්ෂා කරන්න.
(ලකුණු 10)

10. (i) විෂයමාලාව පිළිබඳ අවම වශයෙන් නිර්වචන දෙකක් (02) පරීක්ෂා කරන්න.
(ලකුණු 04)

(ii) ඒ අනුව,

අ) විෂයමාලාවක් සැලසුම් කිරීමේ දී

ආ) විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේ දී

සැලකිලිමත් විය යුතු කරුණු දෙක (02) බැගින් සාකච්ඡා කරන්න.
(ලකුණු 16)

11. (i) විෂයමාලා ඇගයීම යන්නෙන් කුමක් අදහස් කරන්නේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 05)

(ii) විෂයමාලා ඇගයීමේ විවිධ ආකෘති ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(iii) ඔබ ඉහතින් සඳහන් කළ ආකෘති අතුරින් එකක් තෝරාගෙන ශ්‍රී ලංකාවේ ද්විතියික විෂයමාලාව ඇගයීමේදී එහි කාර්යක්ෂමතාව පරීක්ෂා කරන්න.
(ලකුණු 10)

12. (i) විෂයමාලා සංවිධාන ප්‍රවේශ හතරක් (04) නම් කරන්න.
(ලකුණු 04)

(ii) ඉන් එක් ප්‍රවේශයක් තෝරාගෙන එහි ස්වභාවය, කැපී පෙනෙන ලක්ෂණ, වැදගත්කම සහ දුර්වලතා සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සංවිධානයේ දී භාවිතයට ගෙන ඇති විෂයමාලා සංවිධාන ප්‍රවේශ පරීක්ෂා කරන්න.
(ලකුණු 08)

13. (i) පියාජේගේ මනෝවිද්‍යාත්මක අදහස් විෂයමාලා සැළසුම් කිරීම හා සංවිධානය කිරීමේ දී වැදගත් වන අයුරු සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික විෂයමාලාව සැළසුම් කිරීම හා සංවිධානය කිරීමේ දී එම අදහස් කොතෙක් දුරට සැළකිල්ලට ගෙන ඇත්දැයි පරීක්‍ෂා කරන්න.

(ලකුණු 10)

14. පහත දැක්වෙන මාතෘකා අතුරින් ඕනෑම දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

(i) ජාතික ඉගෙනුම් නිපුණතා සහ ඒවායේ අදාළත්වය

(ii) විෂයමාලාව සැළසුම් කිරීම හා සංවර්ධනය කිරීම කෙරෙහි ඇති දාර්ශනික බලපෑම්

(iii) සමාජ සංවර්ධනය සඳහා පාසල් විෂයමාලාව යොදා ගැනීම

(iv) විෂයමාලා කළමනාකරණයේ අවස්ථා

(ලකුණු 10x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -